# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.06.19 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/995/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>**

***பொலிஸ் ஊடகப் பிரிவிற்கு அறிக்கையிடப்பட்ட முக்கிய தகவல்கள்***

**01. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට - දඹගල්ල පොලිස් ස්ථානය.**

2026.06.18 දින උදෑසන දඹගල්ල පොලිස් වසමේ ගල්පොල්ලන්ද රක්ෂිත ප්‍රදේශයේදී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 07 දෙනෙකු කැණීම් උපකරණද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 21 ත් 61 ත් අතර වයස්වල පසුවන දඹගල්ල, මරදන්කඩවල, ග්‍රෑන්ඩ්පාස්, මාතර හා මීගලෑව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දඹගල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***தொல்பொருட்களைத் தேடி அகழாய்வு செய்த 7 பேர் கைது – தம்பகல்ல பொலிஸ் நிலையம்***

*2026.06.18 அன்று காலை, தம்பகல்ல பொலிஸ் பிரிவிற்குட்பட்ட கல்பொல்லந்த பாதுகாக்கப்பட்ட வனப்பகுதியில், தம்பகல்ல பொலிஸ் நிலைய அதிகாரிகள் மேற்கொண்ட சுற்றிவளைப்பில், தொல்பொருட்களைத் தேடும் நோக்கில் சட்டவிரோதமாக அகழாய்வு செய்து கொண்டிருந்த 7 சந்தேகநபர்கள் அகழ்வுப் பொருட்களுடன் கைது செய்யப்பட்டனர்.*

*கைது செய்யப்பட்டவர்கள் 21 முதல் 61 வயதுக்குட்பட்டவர்கள். அவர்கள் தம்பகல்ல, மரதன்கடவல, கிராண்ட்பாஸ், மாத்தறை மற்றும் மீகலேவ பகுதிகளைச் சேர்ந்தவர்கள் ஆவர்.*

*இது தொடர்பான மேலதிக விசாரணைகளை தம்பகல்ல பொலிஸார் மேற்கொண்டு வருகின்றனர்.*

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - උතුරුමැද පළාත් අපරාධ විමර්ශන අංශය.**

2026.06.18 දින දහවල් මිහින්තලය පොලිස් වසමේ අශෝකපුර හන්දියේදී උතුරුමැද පළාත් අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 149 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මිහින්තලය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 24 ක් වන මිහින්තලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිහින්තලය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***"ஐஸ்" போதைப்பொருளுடன் ஒருவர் கைது – வடமத்திய மாகாண குற்ற விசாரணைப் பிரிவு***

*2026.06.18 நண்பகல், மிஹிந்தலை பொலிஸ் பிரிவிற்குட்பட்ட அசோகபுர சந்தியில், வடமத்திய மாகாண குற்ற விசாரணைப் பிரிவு அதிகாரிகள் மேற்கொண்ட சுற்றிவளைப்பில் 149 கிராம் "ஐஸ்" போதைப்பொருளுடன் ஒருவர் கைது செய்யப்பட்டு மிஹிந்தலை பொலிஸ் நிலையத்தில் ஒப்படைக்கப்பட்டுள்ளார்.*

*கைது செய்யப்பட்டவர் 24 வயதுடைய மிஹிந்தலை பகுதியைச் சேர்ந்தவர்.*

*மேலதிக விசாரணைகளை மிஹிந்தலை பொலிஸார் மேற்கொண்டு வருகின்றனர்.*

**03. ගෝඩා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2026.06.18 දින රාත්‍රී කටුනායක පොලිස් වසමේ හීනටියන ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම් දෙකක් සිදුකර නීතිවිරෝධී මත්පැන් පෙරීමට ගන්නා **ගෝඩා ලීටර් 1134 (බැරල් 06) ක් හා ගෝඩා ලීටර් 1512 (බැරල් 08) සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 37 සහ 52 වයස්වල පසුවන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කටුනායක පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***சட்டவிரோத மதுபான உற்பத்திக்கான "கோடா" திரவத்துடன் இருவர் கைது – கட்டுநாயக்க பொலிஸ் நிலையம்***

*2026.06.18 இரவு, கட்டுநாயக்க பொலிஸ் பிரிவிற்குட்பட்ட ஹீனட்டியன பகுதியில் மேற்கொள்ளப்பட்ட இரண்டு தனித்தனி சுற்றிவளைப்புகளில், சட்டவிரோத மதுபானம் காய்ச்சப் பயன்படுத்தப்படும் கோடா கைப்பற்றப்பட்டது.*

முதல் சுற்றிவளைப்பில் 1,134 லீற்றர் (6 பீப்பாய்கள்) மற்றும் இரண்டாவது சுற்றிவளைப்பில் 1,512 லீற்றர் (8 பீப்பாய்கள்) கோடா திரவத்துடன் இரு சந்தேகநபர்கள் கைது செய்யப்பட்டனர்.

கைது செய்யப்பட்டவர்கள் 37 மற்றும் 52 வயதுடைய மினுவாங்கொடை பகுதியைச் சேர்ந்தவர்கள்.

மேலதிக விசாரணைகளை கட்டுநாயக்க பொலிஸார் மேற்கொண்டு வருகின்றனர்.

## 04. බස් රථයක් යතුරුපැදියක ගැටී පැදිකාරිය ජීවිතක්ෂයට - පූනෑව පොලිස් වසම.

2026.06.18 දින උදෑසන පූනෑව පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ මහකුඹුගොල්ලෑව ප්‍රදේශයේදී වව්නියාව දෙසට ධාවනය වූ බස් රථයක් එම දිශාවටම ඉදිරියෙන් ගමන්ගත් යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකාරිය එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකාරිය අවුරුදු 56 ක් වූ පූනෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් බස් රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර පූනෑව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### பேருந்து மோட்டார் சைக்கிளில் மோதிய விபத்தில் பெண் உயிரிழப்பு – பூனேவ பொலிஸ் பிரிவு

2026.06.18 அன்று காலை, பூனேவ பொலிஸ் பிரிவிற்குட்பட்ட A9 வீதியின் மககும்புகொல்லேவ பகுதியில், வவுனியா நோக்கிச் சென்ற பேருந்து ஒன்று அதே திசையில் முன்னால் சென்ற மோட்டார் சைக்கிளில் மோதியதில் விபத்து ஏற்பட்டது.

இந்த விபத்தில் படுகாயமடைந்த மோட்டார் சைக்கிள் ஓட்டிய பெண் சம்பவ இடத்திலேயே உயிரிழந்தார்.

உயிரிழந்தவர் 56 வயதுடைய பூனாவ பகுதியைச் சேர்ந்தவர்.

சம்பவம் தொடர்பாக பேருந்து சாரதி கைது செய்யப்பட்டுள்ளதுடன், மேலதிக விசாரணைகளை பூனாவ பொலிஸார் மேற்கொண்டு வருகின்றனர்.

## 05. කන්ටේනර් රථයක් යතුරුපැදියක ගැටී පසුපැදිකාරිය ජීවිතක්ෂයට - පල්ලෙවෙල පොලිස් වසම.

2026.06.18 දින සවස පල්ලෙවෙල පොලිස් වසමේ මීරිගම පස්යාල මාර්ගයේ කල්එළිය හන්දියේදී මීරිගම දෙසට ධාවනය වූ කන්ටේනර් රථයක් එම දිශාවටම ඉදිරියෙන් ගමන්ගත් යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පසු පැදිකාරිය එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකාරිය අවුරුදු 33 ක් වූ කල්එළිය ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු මීරිගම රෝහලේ ප්‍රතිකාර ලබන අතර කන්ටේනර් රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇත. පල්ලෙවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## *கன்டெய்னர் வாகனம் மோட்டார் சைக்கிளில் மோதிய விபத்தில் பெண் உயிரிழப்பு – பல்லேவெல பொலிஸ் பிரிவு*

*2026.06.18 அன்று மாலை, பல்லேவெல பொலிஸ் பிரிவிற்குட்பட்ட மீரிகம – பஸ்யால வீதியின் கல்எலிய சந்தியில், மீரிகம நோக்கிச் சென்ற கன்டெய்னர் வாகனம் அதே திசையில் முன்னால் சென்ற மோட்டார் சைக்கிளில் மோதியதில் விபத்து ஏற்பட்டது.*

*இந்த விபத்தில் மோட்டார் சைக்கிளின் பின்புறத்தில் பயணித்த 33 வயதுடைய கல்எலிய பகுதியைச் சேர்ந்த பெண் சம்பவ இடத்திலேயே உயிரிழந்தார்.*

*விபத்தில் காயமடைந்த மோட்டார் சைக்கிள் ஓட்டுநர் மீரிகம வைத்தியசாலையில் சிகிச்சை பெற்று வருகிறார்.*

*சம்பவம் தொடர்பாக கன்டெய்னர் வாகன சாரதி கைது செய்யப்பட்டுள்ளதுடன், மேலதிக விசாரணைகளை பல்லேவெல பொலிஸார் மேற்கொண்டு வருகின்றனர்.*

***பொலிஸ் ஊடகப் பிரிவு**.*